# දකුණු පළාත් සභාව

தென் மாகாண சபை

## SOUTHERN PROVINCIAL COUNCIL

**අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය**

கல்வி, காணி மற்றும் காணி அபிவிருத்தி, லைகவ் மற்றும் தகவல்நெடுஞ்சா நுறை அமைச்சு

**Ministry of Education, Land & Land Development, Highways & Information**

බිම් මහල,"දක්ෂිණ පාය", ලබුදුව,ගාල්ල. கீழ் மாடி,"தக்ஷின பாய",லபுதுவ,காலி. Ground Floor,"Dakshina Paya", Labuduwa, Galle.


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. Sp/Edumin/Edu/22/1/2 | ඔබේ අංකය / உனது இல / Your No. | දිනය / திகதி / Date 2026.02. 25 |

ද. ප. අධ්‍යාපන අධ්‍යක්ෂ - ද. ප. අධ්‍යාපන දෙපාර්තමේන්තුව.<br>
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,<br>
ගාල්ල / උඩුගම / ඇල්පිටිය / අම්බලන්ගොඩ.<br>
මාතර / අකුරැස්ස / මුලටියන / දෙනියාය.<br>
හම්බන්තොට / තංගල්ල / වලස්මුල්ල.

**<u>දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම.</u>**

උක්ත තනතුර සම්බන්ධයෙන් දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක SP-PSC/8A/04/03 සහ 2026.02.24 දිනැති ලිපිය මගින් දන්වා ඇති පරිදි දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය විෂය අධ්‍යක්ෂ තනතුර සඳහා දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2025.11.07 දින පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ නමුත් ඒ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂයක් පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවා එම ලකුණු පටිපාටියටම අනුව සම්මුඛ පරීක්ෂණයක් පවත්වා , සම්මුඛ පරීක්ෂණ දෙකෙහිම ඉහළම ලකුණු ලබාගත් නිලධාරියා සුදුසුම නිලධාරියා ලෙස තෝරා පත් කර ගැනීම සුදුසුම ක්‍රමවේදය බව, එම කොමිෂන් සභාව විසින් තීරණය කර ඇති අතර එම තීරණය පරිදි කටයුතු කරන ලෙස ගරු ආණ්ඩුකාරතුමිය විසින් නියෝග කර ඇත.

02. ඒ අනුව දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ( සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය) තනතුර සඳහා **දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2025.11.07 දින පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ නමුත් ඒ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂයක් පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය අනුව සුදුසුකම් සපුරා** ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යාවේ III/II ශ්‍රේණියේ නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවීමට තීරණය කරන ලද අතර ඊට අදාල කොන්දේසි පහත පරිදි වේ.

03. **<u>තනතුර සඳහා සුදුසුකම්-</u>**

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ සේවක සංඛ්‍යාවේ , III ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

අයදුම්කරු, අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2026.03.06 දිනට පූර්වාසන්න වසර 05 තුලදී කිසිදු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර,එම වසර 05 තුලදී සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.


ලේකම් / செயலாளர் / Secretary 091-2246156, 091-2030701

කාර්යාලය / காரியாலயம் / Office 091-2030708 පාලන/நிர்வாகம்/Administration 091-2030705 අධ්‍යාපන/கல்வி/Education 091-2030703 සැලසුම්/திட்டமிடல்/Planning 091-2030702 ගිණුම්/கணக்காய்வ/Accounts

ෆැක්ස් / பெக்ஸ் / Fax 091-2246157, 091-2234044

ඊමේල් / மின்னஞ்சல் / E-mail : secretary@edu.min.spgov.lk

ක්ෂණික ඇමතුම්/ அதிரடி அழைப்பு / Hot Line : 091-2030700

වෙබ් අඩවිය/ இணையத்தளம் / Web site : www.edumin.sp.gov.lk

සෑම අයදුම්කරුවෙකුම තම තනතුරේ සේවය කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

04. **තෝරාගනු ලබන ක්‍රමවේදය-**

ඉහත 03 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලබන අතර, 2025.11.07 දින පැවති සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයදුම්කරුවන් සහ මෙම සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන අයදුම්කරුවන් අතුරින් ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා අදාළ තනතුරට තෝරා ගැනීමට කටයුතු කරනු ලැබේ.(ආදර්ශ අයදුම් පත්‍රය සහ ලකුණු ලබා දීමේ ක්‍රමවේදය මේ සමඟ අමුණා ඇත.)

05.නිලධාරීන් විසින් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් තම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නිර්දේශය සහිතව ඉදිරිපත් කල යුතු වේ.

06. ඒ අනුව ඔබ දෙපාර්තමේන්තුවේ / කලාප අධ්‍යාපන කාර්යාලයේ හා ඒ යටතේ වන ආයතනයන්හි සේවය කරනු ලබන දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2025.11.07 දින පැවති සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී නොවූ නමුත් ඒ සඳහා ඉදිරිපත් වීමට අභිලාෂයක් පවතින ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙසත්, මේ සමඟ අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රය සම්පූර්ණ කර නිසි ධූරාවලිය මඟින් 2026.03.06 දින හෝ ඊට පෙර දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලැබීමට සලස්වන ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

08. මෙම තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණය 2026.03.10 දින දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

එන්.කේ.ආර්.පතිරණ

ලේකම්,

එන්.කේ.ආර්. පතිරණ
ලේකම්
අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන,
මහා මාර්ග හා ප්‍රවෘත්ති අමාත්‍යාංශය
දකුණු පළාත.

## ආදර්ශ අයදුම් පත්‍රය

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුවේ සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන) තනතුර

01.මුලකුරු සමඟ නම -

02.සම්පූර්ණ නම -

03.උපන්දිනය -

04.හැඳුනුම්පත් අංකය -

05.පෞද්ගලික ලිපිනය -

06.දුරකථන අංකය -

07.රාජකාරී ලිපිනය -

08.ඊ මේල් ලිපිනය -

09.ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය -

10. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ පදනම -

(සාමාන්‍ය සේවක සංඛ්‍යා පදනමද/විශේෂ සේවක සංඛ්‍යා පදනමද)

11. ශ්‍රී ලං.අ.ප.සේ.II ශ්‍රේණියට උසස් වී තිබේ නම් එම උසස් වූ දිනය -

12. පූර්වාසන්න වසර 05 තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත -

13. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධක වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| වර්ෂය | සතුටුදායකයි | හොඳයි | විශිෂ්ඨයි |
|---|---|---|---|
| 2020 | | | |
| 2021 | | | |
| 2022 | | | |
| 2023 | | | |
| 2024 | | | |

14. පූර්වාසන්න වසර 05 තුල වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත -

අ. වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර -

15.(i) වර්තමාන සේවා ස්ථානය -

(ii) දරන ස්ථිර තනතුර -

(iii) එම තනතුරට පත් වූ දිනය -

16. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම -:

17.පළාත්,ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලබා ඇත් නම් ඒ පිළිබඳ තොරතුරු -
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය -

........................................
අයදුම්කරුගේ අත්සන

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) ගේ සහතිකය -**

.......................................................................................... මහතා/මහත්මිය/මෙනෙවිය/සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව/නොපැවැත්වෙන බව දන්වන අතර,ඔහු /ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

දිනය -

........................................
අත්සන හා නිල මුද්‍රාව

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය -**

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි/නොවෙමි.

දිනය -

........................................
අත්සන හා නිල මුද්‍රාව

## ආදර්ශ අයදුම් පත්‍රය

## දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුවේ සහකාර/නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන) තනතුර

01.මුලකුරු සමඟ නම -

02.සම්පූර්ණ නම -

03.උපන්දිනය -

04.හැඳුනුම්පත් අංකය -

05.පෞද්ගලික ලිපිනය -

06.දුරකථන අංකය -

07.රාජකාරි ලිපිනය -

08.ඊ මේල් ලිපිනය -

09.ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ දිනය -

10. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට පත් වූ පදනම -

(සාමාන්‍ය සේවක සංඛ්‍යා පදනමද/විශේෂ සේවක සංඛ්‍යා පදනමද)

11. ශ්‍රී ලං.අ.ප.සේ.II ශ්‍රේණියට උසස් වී තිබේ නම් එම උසස් වූ දිනය -

12. පූර්වාසන්න වසර 05 තුල සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත/නැත -

13. පූර්වාසන්න වසර 05 තුල කාර්යසාධනය -

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධක වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| වර්ෂය | සතුටුදායකයි | හොඳයි | විශිෂ්ඨයි |
|---|---|---|---|
| 2020 | | | |
| 2021 | | | |
| 2022 | | | |
| 2023 | | | |
| 2024 | | | |

14. පූර්වාසන්න වසර 05 තුල වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත/නැත -

අ. වැටුප් රහිත නිවාඩු ලබා ගෙන ඇත්නම් ඒ පිළිබඳ විස්තර -

15.(i) වර්තමාන සේවා ස්ථානය -

(ii) දරන ස්ථිර තනතුර -

(iii) එම තනතුරට පත් වූ දිනය -

16. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම -:

17.පළාත්,ජාතික හෝ ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රහණ ලබා ඇත් නම් ඒ පිළිබඳ තොරතුරු -

.....................................................................................................................................................

.....................................................................................................................................................

.....................................................................................................................................................

ඉහත සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

දිනය -

.......................................

අයදුම්කරුගේ අත්සන

<u>**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ/අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (අධ්‍යාපන පරිපාලන) ගේ සහතිකය -**</u>

........................................................................................ මහතා/මහත්මිය/මෙනෙවිය/සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පැවැත්වෙන බව/නොපැවැත්වෙන බව දන්වන අතර,ඔහු /ඇය විසින් සඳහන් කර ඇති තොරතුරු පෞද්ගලික ලිපි ගොනුව අනුව නිවැරදි බව සහතික කරමි.

දිනය -

.......................................

අත්සන හා නිල මුද්‍රාව

<u>**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය -**</u>

ආයතන ප්‍රධානියාගේ නිර්දේශයට එකඟ වෙමි/නොවෙමි.

දිනය -

.......................................

අත්සන හා නිල මුද්‍රාව

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය ) තනතුර සඳහා තෝරා ගැනීමේ ලකුණු පටිපාටිය**

1. ජ්‍යෙෂ්ඨතාවය (උපරිම ලකුණු 15)
ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙකු ලෙස සේවා කාලය (අයදුම්පත් කැඳවන ලද අවසාන දිනට එක් වසරක් සම්පූර්ණ කර තිබේ නම් ලකුණු 01 ක් බැගින් ද, වසරකට අඩු මාස 06 කට වැඩි කාලයක් සඳහා 0.5 ක් බැගින් ද ලකුණු ලබා දෙනු ලැබේ)

2. සේවා කාලය (උපරිම ලකුණු 10)
කලාප අධ්‍යාපන කාර්යාලයක / පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවක/අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ /නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය) ලෙස සේවය කළ සේවා කාලය (අයදුම්පත් කැඳවන ලද අවසාන දිනට එක් වසරක් සම්පූර්ණ කර තිබේ නම් ලකුණු 01 ක් බැගින් ද, වසරකට අඩු මාස 06 කට වැඩි කාලයක් සඳහා 0.5 ක් බැගින් ද ලකුණු ලබා දෙනු ලැබේ)

3. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් (උපරිම ලකුණු 15)
(විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක් /ආයතනයක් මගින් ලබා ගත් සුදුසුකම් සඳහා පමණි)

I. අධ්‍යාපනය හෝ අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හෝ ඊට ඉහළ සුදුසුකම් ලකුණු - 07
II. අධ්‍යාපනවේදී උපාධිය/අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ලකුණු - 05
III. පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව ලකුණු - 03

4. ක්‍රීඩා සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය සම්බන්ධ වෙනත් පාඨමාලා හදාරා තිබීම (උපරිම ලකුණු 04)
(දින 07 කට වැඩි එක් පාඨමාලාවක් සඳහා (එකකට ලකුණු 2 බැගින්)

5. වාර්ෂික කාර්යය සාධන ඇගයුම (උපරිම ලකුණු 15)
සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට පෙර පූර්වාසන්න වසර 05 ක කාල පරිච්ඡේදයක් තුල වාර්ෂික කාර්ය සාධන ඇගයීමේ දී ලබා ගත් ඇගයීම අනුව පහත පරිදි ලකුණු ලබා දෙනු ඇත.

(ආයතන ප්‍රධානියා විසින් සහතික කල කාර්යය සාධක වාර්තා වල පිටපත් අමුණා එවිය යුතුය.)

| කාර්ය සාධන ඇගයීමේ දී ලබා ගත් ඇගයුම් | වසරක් සඳහා ලබා දෙන උපරිම ලකුණු |
|---|---|
| විශිෂ්ය | ලකුණු 3 |
| සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ | ලකුණු 2 |
| සතුටුදායක | ලකුණු 1 |

6. ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය (උපරිම ලකුණු 04)
උපාධිය සඳහා ඉංග්‍රීසි විෂයක් ලෙස හදාරා තිබීම ලකුණු -04
(අ.පො.ස.සා/පෙළ ) ඉංග්‍රීසි විෂය හෝ (අ.පො.ස.උ/පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථය ලකුණු -02

**7.** පරිගණක සාක්ෂරතාවය පිළිබඳ දැනුම (උපරිම ලකුණු 03)

තොරතුරු තාක්ෂණ පුහුණුව (රජය විසින් පිළිගත් ආයතනයකින් ලබා ගත්)

මාස 01 සිට 03 දක්වා පුහුණු සහතික පත්‍ර - ලකුණු 02

මාස 03 ට වැඩි පුහුණු සහතික පත්‍ර - ලකුණු 03

**8.** සේවා ඇගයීම (උපරිම ලකුණු 08)

දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් ,රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් හෝ ඊට ඉහල අධිකාරීන් විසින් නිකුත් කරන ප්‍රශංසා හා දෝශ දර්ශන ආකෘතියට අනුව විධිමත් පරිදි නිකුත් කරන ලද සේවා ඇගයීම් සඳහා (එකකට ලකුණු 2 බැගින් උපරිම සේවා ඇගයීම් 4 ක් සඳහා )

**9.** අධ්‍යාපනයට අදාල පර්යේෂණ සහ ප්‍රකාශන (උපරිම ලකුණු 05)

පරියේෂණ පත්‍රිකාව ප්‍රසිද්ධ කර තිබිය යුතු ය. (එක් ප්‍රකාශනයක් සඳහා ලකුණු 5 බැගින්)

(පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ /නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

**10.** අයදුම්කරුගේ ක්‍රීඩා ජයග්‍රහණ සඳහා (උපරිම ලකුණු 15)

අන්තර් ජාතික මට්ටම - පළමු/දෙවන /තෙවන ස්ථානය/සහභාගීත්වය සඳහා (ලකුණු 07)

ජාතික මට්ටම - පළමු/දෙවන /තෙවන ස්ථානය සඳහා (පිළිවෙලින් 5,4,3 -ලකුණු .05)

පළාත් මට්ටම - පළමු/දෙවන /තෙවන ස්ථානය සඳහා (පිළිවෙලින් 3,2,1 -ලකුණු.03)

සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන දින මෙම සහතික පත් සහ සහභාගීත්වය තහවුරු කරන ලේඛන රැගෙන පැමිණිය යුතු අතර පසුව ඉදිරිපත් කරන ලේඛන සලකා බලනු නොලැබේ.

**11.** චර්යාත්මක නිපුණතා (උපරිම ලකුණු 04)

අයදුම්කරු විසින් දකුණු පළාත් පාසල් ක්‍රීඩා කටයුතු ප්‍රවර්ධනය සඳහා ඉදිරි වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන වැඩ පිළිවෙල පිළිබඳ විනාඩි 03 ක වාචික ඉදිරිපත් කිරීමක් සිදු කල යුතු ය.

**12.** සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය (උපරිම ලකුණු 02)